සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2020(I)**

| | | |
|---|---|---|
| වේලාව: පැය 03 | මූලික සාර්ව ආර්ථික විද්‍යාව (22) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

- **ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

1\. i. දළ දේශීය නිෂ්පාදිතය (GDP) නැමැති සංකල්පය සහ එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. රටක ආර්ථික වර්ධනයට දායක වන සාධක විශ්ලේෂණය කර, දීර්ඝ කාලීන ආර්ථික වර්ධනයක් උදෙසා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් මෙම සාධක ප්‍රවර්ධනය කරන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2\. i. ශ්‍රී ලංකාවේ නුපුහුණු විදේශ රැකියා වල සමාජ හා ආර්ථික වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලාංකීය විදේශ ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ වැඩි කිරීමේ විවිධ ක්‍රමවේද සාකච්ඡා කරන්න. (ලකුණු 15)

3\. i. මුදල් ප්‍රතිපත්ති සංකල්පය සහ එහිලා මහ බැංකුවේ කාර්යභාරය පැහැදිලි කරන්න (ලකුණු 10)

ii. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය හරහා මෑත කාලයේදී ආර්ථිකයට බලපෑම් කළේ කෙසේද? (ලකුණු 15)

4\. i. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ ආර්ථික හා සමාජීය වැදගත්කම විශ්ලේෂණය කරන්න (ලකුණු 10)

ii. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී ශ්‍රී ලංකාවට ඇති අවස්ථා සහ මුහුණ දෙන අභියෝග පරීක්ෂා කර දක්වන්න. (ලකුණු 15)

5\. පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න

i. අයවැය හිඟය

ii. වෙළඳ ශේෂයේ හිඟය

iii. පාරිභෝගික මිල දර්ශකය

iv. උද්ධමනය

v. විදේශ විනිමය සංචිත (ලකුණු 5X5 = 25)

**************